ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# Children’s Voice Forum (CVF)

## අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ළමුන්ගේ අදහස්, අත්දැකීම් හා ආකල්පයන් ඉදිරිපත් කිරීම සඳහා වූ පුරෝගාමී වැඩසටහනක් වන Children’s Voice Forum (CVF) දියත් කිරීමට කටයුතු යොදා ඇති බව සතුටින් දන්වා සිටිමු. එහි අරමුණ වනුයේ ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ( UNCRC ) මූලධර්ම ක්‍රියාත්මක කිරීමේ හා එහි දොළොස්වන වගන්තිය ප්‍රකාරව තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ළමුන්ගේ දායකත්වය ලබා ගැනීම වේ.

CVF මගින් ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ළමුන්ගේ අත්දැකීම් හා අදහස් එක්රැස් කිරීමටත්, සාකච්ඡා වලට සක්‍රීයව සහභාගී වීමට හා ඔවුන්ගේ ගැටලු ප්‍රකාශ කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට කටයුතු සලසයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා ළමුන් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීමටත්, මානව හිමිකම් සඳහා සහභාගිත්ව ප්‍රවේශයක් පෝෂණය කිරීමටත්, කොමිෂන් සභාවේ අනාගත ක්‍රියාකාරකම් සඳහා ළමා අයිතිවාසිකම් ඒකාබද්ධ කිරීම වර්ධනය කිරීමටත් මෙම මුලපිරීම මගින් අපේක්ෂා කරනු ලබයි.

මෙම නියමු වැඩසටහනට සහභාගී වීම සඳහා බස්නාහිර පළාත තුල වයස අවුරුදු 15 - 17 අතර ළමුන්ට අයදුම් කළ හැක. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ළමුන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා අයදුම්පත් යොමු කළ හැක.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2025 ජනවාරි මස 31** වේ.

ඔබට වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ළමා හිමිකම් ඒකකය හා සම්බන්ධ වන්න.

දුරකථන අංකය - **011 2505569**

විද්‍යුත් තැපැල් ලිපිනය - cru.hrcsl@gmail.com

අපි සැවොම එක්ව ළමා හඬ දිරිගන්වා ඔවුන්ගේ අයිතීන් සුරැකීමේ ප්‍රයත්නය ශක්තිමත් කරමු.

රංජිත් උයන්ගොඩ,

ලේකම්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව